# ජේසු බිළිඳුන්ගේ සාන්ත තෙරේසා කන්‍යාව
## (ධර්මදූත ප්‍රදේශවල මංගලෝත්සවයකි.)

පළමුවන දේව ප්‍රකාශනය යෙසායා 66:10–14

*යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.*

"මම සෞභාග්‍යය ගංඟාවක් මෙන් ජෙරුසලම මත හරවන්නෙමි."

ජෙරුසලමට ප්‍රේම කරන සියල්ලෙනි, ඈ උදෙසා ප්‍රීති සන්තෝෂ වන්න. ඈ ගැන වැලපෙන සියල්ලෙනි, ප්‍රීතියෙන් ඈ සමඟ ප්‍රීති වන්න. මෙසේ තුඹලා ඇගේ සැනසිලි ගෙන දෙන පියයුරු උරා, තෘප්තියට පැමිණෙන්නහු ය. ඇගේ බහුල ව ඇති කිරිවලින් ප්‍රීති වන්නහු ය. ඇගේ මහිමය පූර්ණතාවෙන් නොමඳ සොම්නසින් පානය කරන්න. සමිඳාණෝ මෙසේ වදාරන සේක:

"මම සෞභාග්‍යය ගංඟාවක් මෙන් ද ජාතීන්ගේ යසඉසුරු දෙගොඩ තළා යන ඔයක් මෙන් ද ඈ වෙත හරවමි. තුඹලා එයින් උරා බොන්නහු ය. මවකගේ මෙන් ඇගේ උකුලේ තුඹලා ගෙනයනු ලබන්නහු ය. ඇගේ දෙදණ පිට සුරතල් කරනු ලබන්නහු ය. මවක ඇගේ දරුවා සනසන්නාක් මෙන් මම තුඹලා සනසන්නෙමි. තුඹලා ජෙරුසලම තුළ සනසනු ලබන්නහු ය. මෙය දුටු විට තුඹලාගේ සිත් ප්‍රීතියෙන් පිනා යන්නේ ය. එසේ තුඹලා සනීප ශක්තිය ලබන්නහු ය. එවිට සමිඳුන් වන මම මට කීකරු වන්නන්ට ආශිර්වාද කරන බවත්, මාගේ සතුරන්ට උදහස දක්වන බවත් තුඹලා දැනගන්නහු ය.

*දේව වචනය මෙසේ ය.*

# ඔක්තෝබර් 1 ජේසු බිළිඳුන්ගේ සා. තෙරේසා කන්‍යාව මංගලෝත්සවය

## පිළිතුරු ගීය ගීතාවලිය 131:1–3

පිළිතුර: ස්වාමිනි, ඔබගේ සාමයෙන් අප රැක ගත මැනව.

ගීය : සමිඳුනි, මාගේ සිත තුළ අහංකාරයක් නැත.
උදාරම් ලෙස මම ඇස් නොඔසවමි.
වඩා උසස් දේ ගැන වත්,
මාගේ තරම ඉක්මවා යන දේ ගැන වත් මම කරදර නොවෙමි.

ඒ වෙනුවට මම ළද දෙයින් නිහතමානී ව සැනසී සිටිමි.
මවු තුරුල්ලේ සංසුන් ව සිටින ළදරුවෙකු සේ
මා තුළ මාගේ සිත සංසුන් වී ඇත.

එම්බා ඉශ්රායෙල්වරුනි, මෙතැන් පටන් සදහට ම
සමිඳුන් කෙරෙහි බලාපොරොත්තු වන්න.
සදහටම සමිඳුන් කෙරෙහි බලාපොරොත්තු වන්න.

## දෙවන දේව ප්‍රකාශනය එළිදරව්ව 3:14, 20–22

*එළිදරව්ව පොතෙන් උපටා ගත් කොටසකි.*

"යමෙක් මට දොර අරින්නේ නම් මම ඇතුළු වී
ඔහු සමඟ කෑම කන්නෙමි."

"ලවෝදිසයේ සභාවේ දූතයා වෙත මෙසේ ලියන්න: 'විශ්වාසවන්ත, සත්‍ය සාක්ෂිකාරයාණන් වන දෙවියන් වහන්සේගේ මැවිල්ලේ කර්තෘ වූ ආමෙන් නම් තැනැත් වහන්සේ මෙසේ වදාරන සේක. මෙන්න, මම දොර ළඟ සිට තට්ටු කරමි. යමෙක් මාගේ හඬ අසා දොර අරින්නේ නම් මම ඇතුළු වී, ඔහු සමඟ කෑම කන්නෙමි. ඔහු ද මා සමඟ කෑම කන්නේය මා ජයගෙන, පියාණන් වහන්සේ සමඟ, උන් වහන්සේගේ සිංහාසනයේහි හිඳගත්තාක් මෙන්, ජයග්‍රාහකයාට ද මාගේ සිංහාසනයෙහි මා සමඟ හිඳගැන්මට දෙන්නෙමි. 'ආත්මයාණන් වහන්සේ සභාවලට වදාරන දේ කන් ඇත්තේ අසා වා!' "

*දේව වචනය මෙසේ ය.*

## ඔක්තෝබර් 1 ජේසු බිළිඳුන්ගේ සා. තෙරේසා කන්‍යාව මංගලෝත්සවය

### සුපුවත් ජය නද මතෙව් 11:25

ආලේලූයා! ආලේලූයා!
ස්වර්ගයටත්, පොළොවටත් ස්වාමීන් වන පියාණන් වහන්ස,
ඔබ වහන්සේ මේ කරුණු
පැණවතුන් හා නැණවතුන් කෙරෙන් ආවරණය කොට,
බාලයන්ට අනාවරණය කළ හෙයින්
ඔබට තුති පුදමි.
ආලේලූයා!

### සුවිශේෂය මතෙව් 18:1–5, 10

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"ඔබ වෙනස් වී කුඩා දරුවන් මෙන් නොවුවහොත්
කිසිසේත් ස්වර්ග රාජ්‍යයට ඇතුළු නොවන්නහුය."

ශ්‍රාවකයෝ ජේසුස් වහන්සේ වෙතට අවුත් "ස්වර්ග රාජ්‍යයෙහි ඉතා ම උතුම් වන්නේ කවරෙක්දැ"යි ඇසූහ. එවිට උන් වහන්සේ කුඩා දරුවෙකු තමන් වෙතට කැඳවා ඔවුන් මැද සිටුවා මෙසේ වදාළ සේක: "සැබැවින් ම මම ඔබට කියමි, ඔබ වෙනස් වී කුඩා දරුවන් මෙන් නොවුවොත්, කිසි සේත් ස්වර්ග රාජ්‍යයට ඇතුළු නො වන්නහු ය. එබැවින් මේ කුඩා දරුවා මෙන් යටත් වන යමෙක් ඇද්ද, ස්වර්ග රාජ්‍යයෙහි ඉතා ම උතුම් වන්නේ ඔහු ය. තවද, යමෙක් මාගේ නාමයෙන් මෙවැනි කුඩා දරුවෙකු පිළිගන්නේ ද ඔහු මා පිළිගන්නේ ය."

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*